# කාර්යයසාධන වාර්තාව හා ගිණුම්
# செயற்றிறன் அறிக்கையும் கணக்குகளும்
# PERFORMENCE REPORT & ACCOUNTS

2012




**බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**மாவட்டச் செயலகம் பதுளை**

*Badulla District Secretariat*

# බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

## වැය ශීර්ෂය – 276

# 20 12

වර්ෂය සඳහා

# කාර්යයසාධන වාර්තාව හා වාර්ෂික ගිණුම්

# පටුන

පිටු අංකය


- හැඳින්වීම 01
- දැක්ම, මෙහෙවර හා ප්‍රධාන ක්‍රියාකාරකම් 02
- දිස්ත්‍රික්කයේ මූලික සංඛ්‍යා දත්ත 03-08
- පරිපාලන ව්‍යුහය 09
- කාර්යය මණ්ඩල විස්තරය හා සංවිධාන සටහන 10-11
- වාර්ෂික කාර්යය සාධනය
  - පුනරාවර්ථන හා මූලධන 12-19
  - වියදම් ප්‍රභවය 20-22
  - 2012 වර්ෂයේ ආදායම 23
  - පොදු තැන්පත් 24
  - රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම 25
  - වර්ෂයේ අග්‍රිම වාර්තාව 26
  - අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අදාළව 2012 වර්ෂයේ ඉටුකළ කාර්යයන්
    - ගම නැගුම ව්‍යාපෘතිය 27
    - විමධ්‍යගත වැඩසටහන ක්‍රියාත්මක කිරීම 28
    - දිවි නැගුම 29-30
    - සමෘද්ධි වැඩසටහන 31-33
    - 2012 වර්ෂයේ ප්‍රතිපාදන ලැබීම්, වියදම් හා ඉතිරිය 34
    - ප්‍රධාන කාර්යයන් 35
- මහජන සේවා කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකිරීම 36

# හැඳින්වීම

බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් පාලනය වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 15 කි. එකී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 15 තුළ ග්‍රාම නිලධාරී කොට්ඨාශ 567 ක් ඇති අතර, එම ග්‍රාම නිලධාරී කොට්ඨාශ තුළ ගම් 1996 ක් හා දෙමළ ජනතාව ජීවත් වන වතු (වැවිලි) 186 ක් ඇත. ප්‍රාදේශීය සභා 14ක්, නගර සභා 02 ක් හා මහ නගර සභා 01 ක් මෙම දිස්ත්‍රික්කය තුළ දේශපාලන පරිපාලනය හා සම්බන්ධව පවතී.

දිස්ත්‍රික්කයේ පවුල් 227,428කට වැඩි සංඛ්‍යාවක් ඇති අතර, එම පවුල් වල මුළු ජනගහනය 811,758 ක් පමණ වේ. මෙම ජනගහනයෙන් 406,623 ක පිරිසක් සේවා නියුක්තව සිටින අතර, සේවා වියුක්තිකයන් සිටින සංඛ්‍යාව (ශ්‍රම බලකායට අයත්) 16,891 කි.

බදුල්ල දිස්ත්‍රික්කයේ ජීවත් වන ජනතාවගෙන් වැඩි පිරිසකගේ ජීවනෝපාය වන්නේ කෘෂිකර්මාන්තයයි. එනිසා, අඩු ආදායම් ලබන පිරිස ඉහළ මට්ටමක පවතී. රජයේ සමෘද්ධි වැඩසටහන යටතේ ආධාර ලබන සංඛ්‍යාව 59,273 කට ආසන්න වේ. විශ්‍රාම වැටුප් ලබන පිරිස 17,399 කට ආසන්න වේ.

එනිසා මෙම දිස්ත්‍රික්කයේ ජීවත්වන ජනතාවගේ ජීවනෝපාය නගා සිටුවීම සඳහා රාජ්‍ය මට්ටමේ දායකත්වය ලබාදීමත්, එම ජනතාව අපේක්ෂා කරනු ලබන සේවාවන් නොපිරිහෙලා ඉටු කිරීමත්, සමෘද්ධි සහනාධාර ඇතුළු විවිධ සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත්, විශ්‍රාම වැටුප් ගෙවීමත්, ආබාධිතයින් හා ආබාධ වලට ලක් වුවන්ට සහන සැලසීමත්, ජාතික වැදගත් කමක් ඇති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ මැදිහත් කරුවන් ලෙස කටයුතු කිරීමත්, ඇතුළු විවිධ කාර්යයන් රාශියක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මෙහෙයවීමෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඉටුකරනු ලැබේ.

එකී කාර්යයන් ඉටු කිරීමට සහයවීම සඳහා 2012 වර්ෂයට දිස්ත්‍රික් ලේකම් වැය ශීර්ෂය යටතේ රුපියල් මිලියන 540 ක ප්‍රතිපාදන මුදල් ලැබුණි. එයින් මිලියන 477 ක් පුනරාවර්ථන වියදම් සඳහා ද, මිලියන 63 ක් ප්‍රාග්ධන වියදම් සඳහා ද වෙන්විය. එම ප්‍රතිපාදන වලින් රුපියල් මිලියන 520 ක් උපයෝජනය කළ හැකි විය. උපයෝජනය කළ මුදල මුළු ප්‍රතිපාදන මුදලින් 96% ක් පමණ වේ. මෙයට අමතරව වෙනත් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ වලට අදාළ කාර්යයන් රාශියක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඉටුකරනු ලැබේ. 2012 වර්ෂය සඳහා එකී අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් එම කාර්යයන් සඳහා රුපියල් මිලියන 4427 ක ප්‍රතිපාදන මුදලක් වෙන්කර දුනි. එම මුදලින් රුපියල් මිලියන 4283 ක් උපයෝජනය කළ හැකි වූ අතර, එම මුදල මුළු ප්‍රතිපාදනයෙන් 96% ක් පමණ වේ. විවිධ හේතූන් නිසා එම ප්‍රතිපාදනයෙන් 04% ක මුදලක් උපයෝජනය කිරීමට නොහැකි වී ඇත.

ඒ අනුව බදුල්ල දිස්ත්‍රික්කයේ ජීවත් වන ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නංවාලමින්, ප්‍රාදේශීය සංවර්ධනය වේගවත් කිරීම සඳහා රාජ්‍ය මට්ටමේ දායකත්වය නිසි ලෙස සපයමින් සිය කාර්යයන් ඉටුකිරීම මෙම කාර්යාලය හා මෙයට සම්බන්ධව පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල ක්‍රියා කරන ලදී. එනිසා ප්‍රාදේශීය සංවර්ධනයේ රාජ්‍ය මට්ටමේ දායකත්වය 2012 වර්ෂයේද ඉහළ මට්ටමක පැවැතිණි.

## අපේ දැක්ම

"පුරවැසි සංතෘප්තිය තුළින් තිරසාර සංවර්ධනයක් කරා
ප්‍රාදේශීය පරිපාලනය මෙහෙයවීමේ නියමුවා"

## මෙහෙවර

"දිස්ත්‍රික්කය හා එහි ජනතාව ජාතික සංවර්ධනයට දායක වන පරිදි තිරසාර සංවර්ධනයක් උදෙසා රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව මනා සැලැස්මකින් යුතුව, සම්පත් හා ආයතන ඵලදායී ලෙස මෙහෙයවන්නාවූ මනා සම්බන්ධීකරණයක් තුළින් ජනතා අවශ්‍යතා කාර්යක්ෂමව, සාධාරණව, යුක්තිගරුකව හා මිත්‍රශීලීව ඉටු කිරීම"

## ප්‍රධාන ක්‍රියාකාරකම්


- රජයේ කාර්යයන් සම්බන්ධීකරණය කිරීම .
- ආදායම් එකතු කිරීම.
- විමධ්‍යගත අයවැය වැඩසටහන හා ගමනැගුම වැඩසටහන ක්‍රියාත්මක කිරීම .
- මැතිවරණ සම්බන්ධීකරණය කිරීම.
- අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල කාර්යයන් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීමේ නියෝජිතයා ලෙස කටයුතු කිරීම .
- පළාත් සභා කාර්යයන්ට සහය වීම


# දිස්ත්‍රික්කයේ මූලික සංඛ්‍යා දත්ත

## ජනගහනය

බදුල්ල දිස්ත්‍රික්කයේ මුළු ජනගහනය 811,758 කට ආසන්න වේ. එම ජනගහනයෙන් 48% ක් පිරිමින් වන අතර, 52 % ක් කාන්තාවන් වෙති. අවුරුදු 14 ට අඩු ජනගහනය 224,802 කි.

ප්‍රතිශතය




මෙම දිස්ත්‍රික්කයේ ජීවත්වන පිරිසෙන් 50% ක් රැකියා නියුක්තව සිටින නමුත්, යැපෙන්නන්ගේ අනුපාතය ඉහළ අගයක් ගැනීම දැකිය හැකි විශේෂ ලක්ෂණයකි. එම ප්‍රතිශතය 50% කට ආසන්න වේ.


ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින්
භූමි ප්‍රමාණය හා ජනගහණය පිළිබඳ තොරතුරු

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | ග්‍රාම නිළධාරි කොට්ඨාශ | භූමි ප්‍රමාණය ව. කි.මී. | ජනගහනය | | |
|---|---|---|---|---|---|
| | | | පිරිමි | ගැහැණු | එකතුව |
| මහියංගණය | 35 | 601 | 37,170 | 38,157 | 75327 |
| රිදීමාලියද්ද | 42 | 431 | 25,069 | 26,366 | 51435 |
| මීගහකිවුල | 20 | 105 | 9,461 | 10,079 | 19540 |
| කන්දකැටිය | 26 | 157 | 11,266 | 11,923 | 23189 |
| සොරණාතොට | 25 | 79 | 10,715 | 11,780 | 22495 |
| පස්සර | 41 | 136 | 22,939 | 25,637 | 48576 |
| ලුණුගල | 28 | 144 | 14,643 | 16,449 | 31092 |
| බදුල්ල | 29 | 51 | 35,085 | 39,666 | 74751 |
| හාලිඇල | 57 | 165 | 42,732 | 47,447 | 90179 |
| ඌවපරණගම | 68 | 138 | 38,101 | 40,798 | 78899 |
| වැලිමඩ | 64 | 188 | 48,862 | 51,572 | 100434 |
| බණ්ඩාරවෙල | 35 | 71 | 31,039 | 34,072 | 65111 |
| ඇල්ල | 32 | 111 | 21,785 | 22,978 | 44763 |
| හපුතලේ | 26 | 72 | 23,309 | 25,176 | 48485 |
| හල්දුම්මුල්ල | 39 | 412 | 18,140 | 19,342 | 37482 |
| **එකතුව** | **567** | **2,861** | **390,316** | **421,442** | **811,758** |

# සේවා නියුක්තිය

බදුල්ල දිස්ත්‍රික්කයේ මුළු ජනගහනයෙන් 51% ක් එනම්, 439,085 ක් ශ්‍රම බලකායට ඇතුළත් වෙති. එම ශ්‍රම බලකායෙන් 406,623 ක් සේවා නියුක්තව සිටිති. ඒ අනුව බදුල්ල දිස්ත්‍රික්කයේ සේවා නියුක්ත ප්‍රතිශතය 96% කි. මෙවැනි ඉහළ සේවා නියුක්තියක් දක්නට ලැබෙන්නේ මෙම දිස්ත්‍රික්කය තුළ ජීවත්වන අය බොහෝ දෙනෙක් කෘෂිකාර්මික අංශයේ සේවා නියුක්තව සිටින බැවිනි. එය මුළු සේවා නියුක්තියෙන් 64% කි.


| **අංශය** | **සේවා නියුක්තිය** |
|---|---|
| කෘෂිකාර්මික | 256,330 |
| කාර්මික | 45,995 |
| සේවා | 104,298 |
| | 406,623 |




## දිස්ත්‍රික්කයේ ඉඩම් පරිහරණය පිළිබඳ තොරතුරු

මෙම දිස්ත්‍රික්කයට අයත් මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 286,100 කි. එයින් වී, තේ, රබර්, පොල් හා වෙනත් බෝග වගා කරන මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 67,258 කි. එය මුළු ඉඩම් ප්‍රමාණයෙන් 34% කි. හේන් හා ගෙවතු වගා කරන ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 67,745 කට ආසන්න වේ. ඒ අනුව වගා කරන මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 165,075 කට ආසන්න වේ.

| ඉඩම් ස්වභාවය | භූමි ප්‍රමාණය (හෙක්ටයාර) | ප්‍රතිශතය % |
|---|---|---|
| 1. අස්වද්දන ලද කුඹුරු | | |
| 1. වාරිමාර්ග | 23792.0 | 8.3 |
| 11. අහස් දියෙන් | 6365.0 | 2.2 |
| 2. තේ | 34042.0 | 11.9 |
| 3. රබර් | 412.0 | 0.1 |
| 4. පොල් | 3608.0 | 1.3 |
| 5. කුරුඳු | 428.0 | 0.1 |
| 6. වෙනත් වගාවන් | 28264.0 | 9.9 |
| 7. වනාන්තර | | |
| 1. ඝන වනාන්තර | 47782.0 | 16.7 |
| 11. විවෘත වනාන්තර | 26646.0 | 9.3 |
| 111. වගා කරන ලද වනාන්තර | 7034.0 | 2.5 |
| 8. ලඳු කැලෑ හා හේන් | 43566.0 | 15.2 |
| 9. වගුරු | 165.0 | 0.1 |
| 10. ගෙවතු | 24152.0 | 8.4 |
| 11. ජලාශ | 6109.0 | 2.1 |
| 12. ගොඩනැගිලි | 823.0 | 0.3 |
| 13. වැලි හා ගල් පර | 4731.0 | 1.7 |
| 14. මුඩු බිම් හා අත්හරින ලද ඉඩම්(තෘණ බිම් ද ඇතුළත්ව) | 28181.0 | 9.9 |
| එකතුව | 286100.0 | 100.0 |






# සෞඛ්‍ය හා අධ්‍යාපන තොරතුරු

| | | |
|---|---|---|
| මරණ අනුපාතය | (ජනගහනයෙන් දහසකට) | 5.2 |
| උපත් අනුපාතය | (ජනගහනයෙන් දහසකට) | 20.9 |
| ළදරු මරණ අනුපාතය | (සජීවී උපත් දහසකට-වර්ෂය2003) | 9.9 |
| මාතෘ මරණ අනුපාතය | (සජීවී උපත් දහසකට) | 27.5 |

| රෝහල්/ වෛද්‍ය ආයතන | ගණන | සේවකයින් ගණන |
|---|---|---|
| පළාත් මහ රෝහල් | 01 | 1475 |
| මූලික රෝහල් | 03 | 615 |
| ප්‍රාදේශීය රෝහල් | 31 | 1238 |
| වතු රෝහල් | 13 | 104 |




| | |
|---|---|
| *පාසල් සංඛ්‍යාව* | *574* |
| *ගුරුවරු සංඛ්‍යාව* | *12,368* |
| *ශිෂ්‍යයින් සංඛ්‍යාව* | *182,211* |
| *ගුරු ශිෂ්‍ය අනුපාතය* | *15* |

# දරිද්‍රතාවය

## බදුල්ල දිස්ත්‍රික්කයෙ

මෙරට දිස්ත්‍රික්ක අතුරින් ඉහළ දරිද්‍රතාවයක් පෙන්නුම් කරන දිස්ත්‍රික්කයක් වශයෙන් බදුල්ල දිස්ත්‍රික්කය හඳුන්වා දිය හැකිය. යැපෙන්නන්ගේ සංඛ්‍යාව ඉතා ඉහළ මට්ටමක පැවතීමත්, ඒක පුද්ගල ආදායම පහළ මට්ටමක පැවතීමත් ඊට බලපා ඇත. කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය වන නමුත්, මූලික අවශ්‍යතාවයන් ඉටු කර ගැනීමට තරම්වත් ප්‍රමාණවත් ආදායමක් නොලබන සැලකිය යුතු ජනගහනයක් මෙම දිස්ත්‍රික්කයේ ජීවත් වෙති.




**2002 වර්ෂයේ කරන ලද සමීක්ෂණයට අනුව, බදුල්ල දිස්ත්‍රික්කයේ දරිද්‍රතාවය .**


| | දරිද්‍රතා සීමාවට පහළ ජනගහනය මුළු ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස | දරිද්‍රතා සීමාවට පහළ කුටුම්බ ජනගහණය |
|---|---|---|
| **ශ්‍රී ලංකාව** | **22.7** | **3,206,800** |
| **බදුල්ල දිස්ත්‍රික්කය** | **37** | **241,697** |
| මහියංගණය | 38.57 | 24,989 |
| රිදීමාලියද්ද | 51.15 | 22,891 |
| මීගහකිවුල | 46.50 | 8,478 |
| කන්දකැටිය | 46.10 | 10,183 |
| සොරණාතොට | 34.24 | 7,533 |
| පස්සර | 34.88 | 15,395 |
| ලුණුගල | 38.82 | 12,616 |
| බදුල්ල | 17.19 | 11,205 |
| හාලිඇල | 34.58 | 29,672 |
| ඌවපරණගම | 33.35 | 25,054 |
| වැලිමඩ | 29.19 | 26,698 |
| බණ්ඩාරවෙල | 21.61 | 12,363 |
| ඇල්ල | 28.04 | 11,665 |
| හපුතලේ | 24.42 | 11,241 |

මෙම සංඛ්‍යා තොරතුරු අනුව බදුල්ල දිස්ත්‍රික්කයේ ජනගහනයෙන් 37% ක් 2002 වර්ෂයේදි දරිද්‍රතාවයෙන් පෙළුණි . දරිද්‍රතාවයෙන් පෙළෙන මුළු ජනගහනය 241,697 කට ආසන්න වේ. දරිද්‍රතාවය ඉහළම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ලෙස රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය දැක්විය හැක. එම කොට්ඨාශයේ මුළු ජනගහනයෙන් 51% ක් පමණ දරිද්‍රතාවයෙන් පෙළෙති.


2006 – 2007 වර්ෂ වල කරන ලද සමීක්ෂණය අනුව මෙම දිස්ත්‍රික්කයේ දරිද්‍රතාවය 23.7% දක්වා අඩු වී ඇති නමුත්, මෙරට දරිද්‍රතා මට්ටම වන 15.2% හා සසඳා බලන විට එය ඉතා ඉහළ අගයකි. 2009/2010 සමීක්ෂණයට අනුව බදුල්ල දිස්ත්‍රික්යේ දුරිද්‍රතාවය 13.3 වේ. එනිසා මෙම දිස්ත්‍රික්කයේ දිලිඳුකම පිටු දැකීම සඳහා ක්‍රියාත්මක කරන බොහෝමයක් වැඩසටහන් අපේක්ෂිත ඉලක්ක ලඟා කරගෙන ඇත් ද යන ප්‍රශ්නය මතු කරයි . එනිසා මෙම දිස්ත්‍රික්කයේ දිලිඳුකම පිටුදැකීමට විධිමත් වැඩපිළිවෙලක අවශ්‍යතාවය ඒ තුලින් මතු කරයි .

# ප්‍රධාන නිෂ්පාදන
## බදුල්ල දිස්ත්‍රික්කයේ

බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රධාන කෘෂි නිෂ්පාදනය වන්නේ වී වගාවයි. 2010 වර්ෂයේ වී නිෂ්පාදනය මෙ.ටොන් (දහස්) 125,845 ක් පමණ වේ. 2011 වර්ෂයේ යල කන්නයේ වී නිෂ්පාදනය මෙ.ටොන් 48,036 ක් වන අතර, එම අගය හා සසඳා බලන කල වී නිෂ්පාදනයේ ප්‍රමාණවත් වර්ධනයක් මෙම කාලය තුල සිදු වී නැති බව පෙනී යයි.




වී නිෂ්පාදනයට අමතරව තේ,පොල් හා රබර් වගාවන් මෙන්ම පුවක්, ගම්මිරිස්,එනසාල් ඇතුළු අනෙකුත් බෝගයන් ද මෙම දිස්ත්‍රික්කය තුළ නිෂ්පාදනය කරති.




***ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් කෘෂිකාර්මික බෝග වගාව***

(හෙක්ටයාර් වලින් )

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | තේ | රබර් | පොල් |
|---|---|---|---|
| මහියංගණය | – | – | 1310.8 |
| රිදීමාලියද්ද | – | – | 963.4 |
| මීගහකිවුල | 693 | 20.4 | 133.5 |
| කන්දකැටිය | 1330 | – | 233.0 |
| සොරණාතොට | 691 | 66.8 | 107.5 |
| පස්සර | 3224 | 0.4 | 117.4 |
| ලුණුගල | 3929 | 97.8 | 116.8 |
| බදුල්ල | 819 | – | 106.0 |
| හාලිඇල | 5880 | – | 112.2 |
| ඌවපරණගම | 2483 | – | 107.9 |
| වැලිමඩ | 35.64 | – | 13.0 |
| බණ්ඩාරවෙල | 2505 | – | 10.8 |
| ඇල්ල | 3608 | – | 48.6 |
| හපුතලේ | 2670 | – | 3.8 |
| හල්දුම්මුල්ල | 2646 | 226.7 | 223.3 |
| එකතුව | 34042 | 412.1 | 3608.0 |

## බදුල්ල දිස්ත්‍රික්කයේ ස්ථිර හා අර්ධ ස්ථිර බෝග වගා කළ බිම් ප්‍රමාණය හා අස්වැන්න


| බෝගය | වගා කළ බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) | | නිෂ්පාදනය | |
|---|---|---|---|---|
| | ඵලදරන | ඵලනොදරන | ඒකක | ප්‍රමාණය |
| කුරුඳු | 309.22 | 119.09 | කි.ග්‍රෑම් | 261,723 |
| කෝපි | 314.91 | 148.95 | කි.ග්‍රෑම් | 228,064 |
| කොකෝවා | 13.84 | 11.23 | කි.ග්‍රෑම් | 8,771 |
| ගම්මිරිස් | 2,856.24 | 553.46 | කි.ග්‍රෑම් | 2,518,639 |
| කරදමුංගු | 3.00 | 0.40 | කි.ග්‍රෑම් | 1,912 |
| කරාබු | 34.93 | 11.16 | කි.ග්‍රෑම් | 25,024 |
| පුවක් | 1,122.20 | 308.64 | කි.ග්‍රෑම් | 7,658,542 |
| කජු | 539.62 | 259.80 | දහස්ගණන් | 99,919 |
| දොඩම් | 384.08 | 196.76 | ගණන | 9,932,757 |
| දෙහි | 502.91 | 204.01 | ගණන | 20,003,812 |
| අඹ | 710.01 | 338.56 | ගණන | 21,871,245 |
| කොස් | 1,524.09 | 462.13 | ගණන | 7,365,639 |
| දෙල් | 167.57 | 52.13 | ගණන | 1,982,345 |
| උක් | 22.20 | 5.60 | කි.ග්‍රෑම් | 875,456 |
| කෙසෙල් | 1,990.86 | 542.91 | කැන් ගණන | 1,620,693 |
| පැපොල් | 213.08 | 101.27 | ගණන | 2,646,375 |
| අන්නාසි | 108.05 | 54.59 | ගණන | 1,245,837 |
| පැෂන් ෆෘට් | 8.51 | 5.30 | ගණන | 165,582 |
| බුලත් | 42.49 | 16.10 | දහස්ගණන් | 23,236 |


මූලාශ්‍රය -සංඛ්‍යාලේඛන අංශය, බදුල්ල.

කෘෂිකර්මාන්තය හා බැඳී පවතින ආර්ථික ක්‍රමවේදයක් මෙම දිස්ත්‍රික්කයේ ජනතාව තුල දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණය වන බැවින් දිස්ත්‍රික්කයේ ජනතාවගේ දිලිඳුකම පිටු දැකීමට වී වගාව, තේ, පොල් හා රබර් වගාවන් මෙන්ම අනෙකුත් බෝග වගාවන් ඉලක්ක ආදායම් ඉපයීමේ ප්‍රවේශයක් කරා යොමු කල යුතුව ඇත. විශේෂයෙන්ම සාම්ප්‍රදායික වගා ක්‍රම වලින් බැහැරව නූතන තාක්ෂණික ක්‍රමවේදයක් ඔස්සේ නිෂ්පාදනය වර්ධනය කිරීමට අවශ්‍ය මග පෙන්වීම රාජ්‍ය අංශය ඔස්සේ ලබාදිය යුතුව ඇත. පෙර සඳහන් කළ පරිදි 2002 වර්ෂයට සාපේක්ෂව 2007 වර්ෂයේ මෙම දිස්ත්‍රික්කයේ දරිද්‍රතාවය 37% ක මට්ටමක සිට 22.7% දක්වා අඩුවී තිබුනද , ඒ තුල යථාර්තය පිළිබිඹු වන්නේ ද යන ප්‍රශ්නය මතුකරයි. එම අඩුවීම තව දුරටත් රඳවා ගැන්වීමටත්, හැකිතාක් දුරට දිස්ත්‍රික්කයේ දරිද්‍රතාවය අඩු කර ගැනීමටත් මෙම දිස්ත්‍රික්කයේ නිෂ්පාදන ආර්ථිකයේ තිරසාර වර්ධනයක් සිදු විය යුතුව ඇත. හුදු සේවා ගලා යාම් තුලින් දරිද්‍රතාවය අඩුවීම සැබෑ යථාර්තය නිරූපනය නොවන්නකි.


ඒ නිසා රජයේ මගපෙන්වීම මත දිස්ත්‍රික්කයේ දිලිඳු බව අඩු කිරීමට නිෂ්පාදන වර්ධන ආර්ථික ක්‍රමයක් ගොඩ නැංවීමට ක්‍රියා කල යුතුව ඇත.

# පරිපාලන ව්‍යුහය



## බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ




බදුල්ල දිස්ත්‍රික් ලේකම් යටතේ පාලනය වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 15 කි. එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 15 තුළ ග්‍රාම නිලධාරී කොට්ඨාශ 567 පවතී. එම ග්‍රාම නිලධාරී කොට්ඨාශ 567 හි ගම් 1996 ක්ද, වතු 186 ක්ද, පිහිටා ඇත. පළාත් පාලන ආසන මට්ටමෙන් ගත් විට ප්‍රාදේශීය සභා 13 ක්, නගර සභා 02 ක් හා මහ නගර සභා 01 ක් පවතී.

## කාර්ය මණ්ඩල විස්තරය හා සංවිධාන සටහන


### අනුමත කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර .

| තනතුරු නාමය | අනුමත තනතුරු සංඛ්‍යාව | 2012 වර්ෂයේ සත්‍ය සේවක සංඛ්‍යාව |
|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | |
| දිස්ත්‍රික් ලේකම් ශ්‍රී . ල ප. සේ 1 | | 1 |
| අතිරේක දිස්ත්‍රික් ලේකම් ශ්‍රී . ල ප. සේ 1 | 1 | 1 |
| ප්‍රාදේශීය ලේකම් ශ්‍රී . ල ප. සේ 1 | 15 | 15 |
| ප්‍රධාන ගණකාධිකාරි ශ්‍රී.ල.ග.සේ 1 | 1 | 1 |
| දිස්ත්‍රික් ඉංජිනේරු ශ්‍රී . ල ඉ. සේ 11/11 | 1 | 1 |
| සහකාර දිස්ත්‍රික් ලේකම් ශ්‍රී . ල ප. සේ 11/11 | 1 | 1 |
| සහකාර ප්‍රාදේශීය ලේකම් ශ්‍රී . ල ප. සේ 11/11 | 15 | 12 |
| ගණකාධිකාරි ශ්‍රී.ල.ග.සේ. | 16 | 12 |
| උප එකතුව | 51 | 44 |
| **තෘතිය මට්ටම** | | |
| පරිපාලන නිලධාරි (සා.ලි.සේ අධිපන්තිය) | 16 | 12 |
| ග්‍රාම නිලධාරි (අධි පන්තිය) | 15 | 7 |
| භාෂා පරිවර්තක | 4 | 2 |
| **උප එකතුව** | **35** | **21** |
| **ද්විතීයික මට්ටම** | | |
| අයවැය සහකාර | 2 | 2 |
| සංවර්ධන සම්බන්ධීකාරක | 16 | 11 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර (රා.ක.සේ 1,11,111) | 385 | 355 |
| පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු | 17 | 8 |
| කාර්මික නිලධාරි (276 වැටුප් ලබන ) | 26 | 19 |
| සැළසුම් ශිල්පි (276 වැටුප් ලබන ) | 5 | 1 |
| ග්‍රාම නිලධාරි - 1, 11 | 567 | 414 |
| පිළිගැනිමේ නිලධාරි | 1 | 1 |
| **උප එකතුව** | 1019 | 811 |
| **ප්‍රාථමික මට්ටම** | | |
| රියදුරු - 1, 11 | 33 | 30 |
| කාර්යාල කාර්යය සහායක (කා.සේ .සේ - 1,11) | 75 | 80 |
| මුරකරු | 21 | 07 |
| සනීපාරක්ෂක කම්කරු | 16 | 05 |
| අනියම්/ආදේශක/තාවකාලික කම්කරු | | 24 |
| *උප එකතුව* | 145 | 146 |
| | | |
| **එකතුව** | **1250** | **1022** |

## වාර්ෂික කාර්යය සාධනය


දිස්ත්‍රික් ලේකම් වැය ශීර්ෂය යටතේ මෙහෙයුම් වැඩසටහන නමින් එක් වැඩසටහනක් පමණක් පවතී. එම වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති තුනකි.

- සාමාන්‍යය පරිපාලනය සහ ආයතන සේවා– දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල
- මහියංගන හා බිංතැන්න කොට්ඨාශ




2012 වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් වැය ශීර්ෂය යටතේ වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන මුදල රු.මිලියන 540 කි. මෙම මුදලින් රු. මිලියන 477 පුනරාවර්ථන වියදම් සඳහාද රු.මිලියන 63 ක් මූලධන වියදම් සඳහා ද වෙන්කර තිබුණි.

පුනරාවර්ථන වියදම් සඳහා 2012 වර්ෂයට වෙන් කළ ප්‍රතිපාදන මුදලින් රු.මිලියන 467 ක් උපයෝජනය කරන ලදී. . එය ප්‍රතිපාදන මුදලින් 98% කි . ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් වූ ප්‍රතිපාදන මුදලින් 82 %ක උපයෝජනය කිරීමට හැකිවූ අතර, විවිධ හේතුන් නිසා 18%ක් ඉතිරි විය.




2011 වර්ෂය හා සසදා බලන කල 2012 වර්ෂයේ පුනරාවර්ථන වියදම්වල ඉහළ යාමක් පෙන්නුම් කිරීම දැකිය හැකි විශේෂිත ලක්ෂණයකි. 2011 වර්ෂයේ මුළු පුනරාවර්තන වියදම රු. මිලියන 364 කි . 2012 වර්ෂයේදි එය රු මිලියන 467 කි .

# විසර්ජන ගිණුම 2012

වියදම් ශීර්ෂ අංකය: 276 අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය බදුල්ල .

| වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් වැඩසටහන් අංකය | වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් වැඩසටහනෙහි නම | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මු.රෙ. 66 සහ 69 අනුව මාරු කිරීම් | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1-2)+3+4 | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ (අතිරික්තය) (4-5) | පිටු අංකය (අදාල ඩී.ජේ.එස්.ජේ. 2 ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු | |
| 01 | **පුනාරාවර්තන**<br>මෙහෙයුම් වැඩසටහන | 398,075,000 | 79,450,217 | 0 | 477,525,217 | 467,265,617 | 10,259,600 | |
| | **උප එකතුව (පුනාරාවර්තන)** | 398,075,000 | 79,450,217 | 0 | 477,525,217 | 467,265,617 | 10,259,600 | |
| 01 | **මූලධන**<br>මෙහෙයුම් වැඩසටහන | 62,650,000 | 0 | 0 | 62,650,000 | 52,400,948 | 10,249,052 | |
| | **උප එකතුව (මූලධන)** | 62,650,000 | 0 | 0 | 62,650,000 | 52,400,948 | 10,249,052 | |
| 01 | පුනාරාවර්තන එකතුව | 398,075,000 | 79,450,217 | 0 | 477,525,217 | 467,265,617 | 10,259,600 | 02 |
| 01 | මූලධන එකතුව | 62,650,000 | 0 | 0 | 62,650,000 | 52,400,948 | 10,249,052 | 02 |
| - | **මුළු එකතුව** | 460,725,000 | 79,450,217 | 0 | 540,175,217 | 519,666,565 | 20,508,652 | |
| | | | | | | | | |

පිටු අංක 02 සිට 20 දක්වා ඩී.ජේ.එස්.ජේ. 2 සිට 10 දක්වාවූ ආකෘතිපත්‍ර වලින් ඉදිරිපත් කෙරෙන විස්තරාත්මක වැඩසටහන් විසර්ජන ගණුම් ප්‍රකාශයන්ද අංක 21 සිට 32 දක්වාවූ අනෙකුත් අදාල සටහන්ද මෙම විසර්ජන ගිණුමෙහිම අන්තර්ගත කොටසක් ලෙස සැකසේ.


මෙම ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, අනිකුත් සවිස්තරාත්මක ප්‍රකාශන හා අනිකුත් සටහන් නිවැරදි බවත්, භාණ්ඩාගාර ගිණුම් පොත් සමග අදාල ගිණුම් සැසඳීම් කරන ලද බවත් ඒවා නිවැරදි බවට තහවුරු වී ඇති බවත් මෙයින් සහතික කරමි.

ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම:
දිනය :


ගණන්දීමේ නිලධාරී
නම:
තනතුර:
දිනය :

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නම:
තනතුර:
දිනය :


**"සාමාන්‍ය පරිපාලන සහ ආයතන සේවා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය"** යන ව්‍යාපෘතිය යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පුනරාවර්ථන වියදම් සඳහා හා ප්‍රාග්ධන වියදම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සළසා දී තිබුණි. ඒ අනුව, 2012 වර්ෂය සඳහා එම වැය ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 108.8 ක ප්‍රතිපාදන මුදල් වෙන් කෙරුණි. එයින් මිලියන 99.2 පුද්ගල පඩිනඩි සඳහා ද මිලියන 9.6 ක් අනෙකුත් පුනරාවර්ථන වියදම් සඳහා ද විය. එම මුදලින් 99.7 % ක් උපයෝජනය විය.




02 වන ව්‍යාපෘතිය වන**"ප්‍රාදේශීය ලේකම් කාර්යාල"** ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක් සඳහා ප්‍රතිපාදන සලසා තිබුණි. බදුල්ල, පස්සර, හාලිඇල, වැලිමඩ, ඌවපරණගම, බණ්ඩාරවෙල, ඇල්ල, හපුතලේ, හල්දුම්මුල්ල සහ ලුණුගල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල එයට අයත් වේ. එම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 261.4 ක් 2012 වර්ෂය සඳහා වෙන්වූ අතර, එයින් මිලියන 233.9 ක් පුද්ගල පඩිනඩි සඳහාද මිලියන 27.5 ක් අනෙකුත් පුනරාවර්ථන වියදම් සඳහාද වෙන්කර තිබුණි. මෙම මුදලින් 98% ක් උපයෝජනය කර තිබුණි.




03 වන ව්‍යාපෘතිය වන **"මහියංගණ හා බිංතැන්න කොට්ඨාශය"** යන ව්‍යාපෘතිය සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් ඇතුලත් වේ. මහියංගණ, රිදීමාලියද්ද, මීගහකිවුල, කන්දකැටිය, සොරණාතොට යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල පුද්ගල පඩිනඩි සඳහා රුපියල් මිලියන 94.3 ක් වෙන්වූ අතර, අනෙකුත් පුනරාවර්ථන වියදම් සඳහා වෙන්වූ මුදල රු.මිලියන 12.9 කි. ඒ අනුව, ව්‍යාපෘතිය සඳහා 2012 වර්ෂයට රු.මිලියන 107.2 ක මුදලක් වෙන්විය. එම මුදල් ප්‍රතිපාදනවලින් රු.මිලියන 103.4 ක් වැය වී තිබුණි.



# වැඩසටහන් අනුව විසර්ජන ගිණුම 2012

වියදම් ශීර්ෂ අංකය: 276 අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය බදුල්ල .

වැඩ සටහන් අංකය හා නාමය : 01 - මෙහෙයුම් වැඩසටහන

## පුනරාවර්තන හා මූලධන වියදම් සාරාංශය

| වියදමෙහි ස්වභාවය (ඩී.ජී.එස්.ජ්. ආකෘති යොමුව සමග) | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් රු. | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් රු. | (3) මු.රෙ. 66 සහ 69 අනුව මාරු කිරීම් රු. | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1-2)+3+4 රු. | (5) මුළු වියදම රු. | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ (අතිරික්තය) (4-5) රු | පිටු අංකය (අදාළ ඩී.ජී.එස්.ජ්. ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|
| (අ) පුනරාවර්තන (ඩී.ජී.එස්.ජ්. 3) | 398,075,000 | 79,450,217 | 0 | 477,525,217 | 467,265,617 | 10,259,600 | 03 |
| (ආ) මූලධන (ඩී.ජී.එස්.ජ්. 4) | 62,650,000 | 0 | 0 | 62,650,000 | 52,400,948 | 10,249,052 | 04/05/0 |
| එකතුව | 460,725,000 | 79,450,217 | 0 | 540,175,217 | 519,666,565 | 20,508,652 | |



ප්‍රධාන ගණකාධිකාරි

නම:

දිනය :

# ව්‍යාපෘති අනුව පුනරාවර්තන වියදම්

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය බදුල්ල .

වියදම් ශීර්ෂ අංකය: 276

වැඩ සටහන් අංකය හා නාමය : 01 - මෙහෙයුම් වැඩසටහන

| ව්‍යාපෘති අංකය /නම, පෞද්ගලික පඩිනඩි සහ සියළුම ව්‍යාපෘති සඳහා අතිකුත් අයකිරීම් | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මු.රෙ. 66 සහ 69 අනුව මාරු කිරීම් | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1-2)+3+4 | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රථිඵලය ඉතිරිය/ (අතිරික්තය) (4-5) |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු |
| 01- සාමාන්‍ය පරිපාලනය සහ ආයතන සේවා - දිසත්‍රික් ලේකම් කාර්යාලය | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 19,550,000 | 79,450,217 | 280,000 | 99,280,217 | 98,981,445 | 298,772 |
| අනෙකුත් වියදම් | 9,625,000 | 0 | (12,675) | 9,612,325 | 9,597,777 | 14,548 |
| උප එකතුව | 29,175,000 | 79,450,217 | 267,325 | 108,892,542 | 108,579,222 | 313,320 |
| 02- ප්‍රාදේශීය ලේකම් කාර්යාල | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 230,000,000 | 0 | 3,870,000 | 233,870,000 | 228,661,094 | 5,208,906 |
| අනෙකුත් වියදම් | 26,775,000 | 0 | 763,000 | 27,538,000 | 26,589,520 | 948,480 |
| උප එකතුව | 256,775,000 | 0 | 4,633,000 | 261,408,000 | 255,250,614 | 6,157,386 |
| 03 මහියංගන හා බිංතැන්න කොට්ඨාශය | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 98,500,000 | 0 | (4,150,000) | 94,350,000 | 90,955,381 | 3,394,619 |
| අනෙකුත් වියදම් | 13,625,000 | 0 | (750,325) | 12,874,675 | 12,480,400 | 394,275 |
| උප එකතුව | 112,125,000 | 0 | (4,900,325) | 107,224,675 | 103,435,781 | 3,788,894 |
| මුළු එකතුව | 398,075,000 | 79,450,217 | 0 | 477,525,217 | 467,265,617 | 10,259,600 |




ප්‍රධාන ගණකාධිකාරී

නම:

දිනය :

## ව්‍යාපෘති අනුව මුලධන වියදම්


2012 වර්ෂය සඳහා මෙම වැය ශීර්ෂය යටතේ වෙන් කළ ප්‍රතිපාදන මුදල රු.මිලියන 62.6 කි. එම ප්‍රතිපාදන මුදලින් රු.මිලියන 52.4 ක් උපයෝජනය කර ඇත. එයින් රු.මිලියන 19.1 ක් ගොඩනැගිලි අළුත්වැඩියා සඳහාත් , රු. මිලියන 0.814 ක් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා සඳහාත් රු.මිලියන 1.2 ක් වාහන අළුත්වැඩියාව සඳහාත් යොදවා ඇත. මුලධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා 2012 වර්ෂයට දරණ ලද වියදම රු.මිලියන 21.1 කි. එම මුදලින් රු.මිලියන 2.3 ක් උපකරණ මිළදී ගැනිම සඳහා වැය විය.




ගොඩනැගිලි ඉදිකිරීම සඳහා 2012 වර්ෂයේ යොදවා ඇති මුදල රු.මිලියන 26.3 කි. පුහුණු කිරීම් හා හැකියා වර්ධනය සඳහා රු.මිලියන 1. 2 කට ආසන්න මුදලක් යොදවන ලදී.

### පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්

2006 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කරන ලද බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 332.9 කි. 2006 වර්ෂයේ රු.මිලියන 61.7ක් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා යොදවන ලද අතර, එය 2007 වර්ෂයේදී රු.මිලියන 72.5 ක් දක්වා වැඩිවිය. එහි ඉදිකිරීම් සඳහා 2008 වර්ෂයේදී රු මිලියන 84 ක් පමණ දිස්ත්‍රික් ලේකම් වැය ශිර්ෂය යටතේ දරණ ලද අතර, රාජ්‍ය පරිපාලන අමාත්‍යංශ වැය ශීර්ෂය යටතේද රු මිලියන 5 ක් 2008 වර්ෂයේ දී දරණ ලදි. 2009 වර්ෂයේ දරන ලද වියදම රු මිලියන 80 කි .ඒ සඳහා 2012 වර්ෂයේදි රු මි. 26.2 ඉදිකිරීම් ආයතනයට ගෙවා ඇත. මේ වනවිට ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් වී ඇත.




ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පවතින උපකරණ හිඟය මගහරවා ගැනීමටත්, සේවාවන්හි කාර්යක්ෂමතාව වැඩි කිරීමටත් අපේක්ෂා කර උපකරණ හිඟ කාර්යාල සඳහා මේස, පුටු, පරිගණක, ඡායා පිටපත් යන්ත්‍ර, රිසෝ යන්ත්‍ර ආදි උපකරණ මිළදී ගැනීම ද සිදු කරන ලදී.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ට අයත් කාර්යාල ගොඩනැගිලි හා නිල නිවාස වල අඩුපාඩු බොහෝමයක් පැවැතියත් 2012 වර්ෂයේ එම ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම සඳහා මුලධන වැය විෂය යටතේ රු මිලියන 19.5 ක මුදලක් වෙන් විය. එම මුදලින් රු මිලියන 19.1 ක ගොඩනැගිලි අළුත්වැඩියාවන් සිදු කිරීමට 2012 වර්ෂයේ දී හැකිවුණි.

පුනරාවර්තන වැය විෂයන් යටතේ නිලධාරීන් පුහුණු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කළ ද මානව සම්පත් සංවර්ධනය අයෝජකයන් සේ සලකමින් 2007 වර්ෂයේ සිට මුලධන වැය විෂයකට මාරු කර ඇත. ඒ අනුව ව්‍යාපෘති 01 සඳහා රු. 1,200,000 , ක් 2012 වර්ෂයේ පුහුණු කිරීම හා හැකියා වර්ධන සඳහා වෙන් කර තිබුණි. එම ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල නිලධාරීන් පුහුණු කිරිම සඳහා යොදවන ලදි. මෙම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානයේදී නිලධාරීන් විශාල ප්‍රමාණයක් පුහුණු කරන ලදි.

01. “Computer Driving Licences” පාඨමාලාව
02. පරිගණක පුහුණුවට අදාල මූලික පාඨමාලා
03. පරිගණක ගත ගිණුම්කරණ පාඨමාලා
04. පරිගණක ඩිප්ලෝමා පාඨමාලාව

වැනි පුහුණු පාඨමාලා පවත්වන ලදි. මෙයට අමතරව ඵලදායි රාජ්‍ය සේවයක් ගොඩනැංවීමට අදාලව ආකල්පමය වෙනසක් නිලධාරීන් තුල ඇති කිරීම සඳහා වන පාඨමාලාවල්ට නිලධාරීන් සම්බන්ධ කරන ලදි.



**ඉදිවී ඇති**
**බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාල නව ගොඩනැගිල්ල**



**දිස්ත්‍රික් ලේකම් කාර්යාල පැරණි ගොඩනැගිල්ල**

# ව්‍යාපෘති අනුව මූලධන වියදම්

වියදම් ශීර්ෂ අංකය: 276 අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය බදුල්ල .

වැඩ සටහන් අංකය හා නාමය 01 - මෙහෙයුම් වැඩසටහන

ව්‍යාපෘති අංකය හා නාමය: 01 - සාමාන්‍ය පරිපාලනය සහ ආයතන සේවා - දිසතක් ලේකම් කාර්යාලය


| වැය විෂය අංකය | අයිතම අංකය | මූල්‍යකරණය (සංකේත අංකය) | අයිතම් විස්තරය | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | (2) මු.රෙ. 66 සහ 69 අනුව මාරු කිරීම් පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2) | (4) මුළු වියදම | (5) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ (අතිරික්තය) (3-4) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | රු. | රු. | රු. | රු |
| | | | * මූලධන වත්කම්වල පුනුරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | | | | | |
| 2001 | | 11 | ගොඩනැගිලි පුනුරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 12,000,000 | 7,561,000 | 19,561,000 | 19,114,670 | 446,330 |
| 2002 | | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ පුනුරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 750,000 | 100,000 | 850,000 | 814,100 | 35,900 |
| 2003 | | 11 | වාහන පුනුරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 1,000,000 | 200,000 | 1,200,000 | 1,172,474 | 27,526 |
| | | | උප එකතුව | 13,750,000 | 7,861,000 | 21,611,000 | 21,101,245 | 509,755 |
| | | | | | | aREF! | | - |
| | | | * මූලධන වත්කම් අත්පත් කර ගැනීම | | | | | - |
| 2102 | | 11 | ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ මිලදී ගැනීම | 3,000,000 | - | 3,000,000 | 2,277,100 | 722,900 |
| 2103 | | 11 | යන්ත හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | 1,500,000 | | 1,500,000 | 1,486,371 | 13,629 |
| 2104 | | 11 | ගොඩනැගිලි ඉදිකිරීම | 42,400,000 | (7,861,000) | 34,539,000 | 26,336,558 | 8,202,442 |
| *2104* | *01* | *11* | *දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - බදුල්ල* | *25,000,000* | *1,150,200* | 26,150,200 | **26,150,190** | *10* |
| *2104* | *02* | *11* | *ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - බණ්ඩාරවෙල* | *5,400,000* | *(1,150,200)* | 4,249,800 | **186,368** | *4,063,432* |
| *2104* | *10* | *11* | *බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගණකාධිකාරි නිල නිවස ඉදිකිරීම* | *6,000,000* | *(4,511,000)* | *1,489,000* | - | *1,489,000* |
| *2104* | *11* | *11* | *බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සෘද නිවස ඉදිකිරීම* | *6,000,000* | *(3,350,000)* | *2,650,000* | - | *2,650,000* |
| | | | උප එකතුව | 46,900,000 | (7,861,000) | 39,039,000 | 30,100,030 | 8,938,970 |
| | | | * හැකියා වර්ධනය | | | | | |
| 2401 | *01* | 11 | පුහුණු කිරීම් සහ හැකියා වර්ධන | 1,200,000 | - | 1,200,000 | 1,199,674 | 326 |
| 2401 | *02* | 11 | සංවර්ධන කාර්යය- දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය | 800,000 | - | 800,000 | - | 800,000 |
| | | | උප එකතුව | 2,000,000 | - | 2,000,000 | 1,199,674 | 800,326 |
| | | | | | | | | |
| | | | එකතුව | 62,650,000 | - | 62,650,000 | 52,400,948 | 10,249,052 |

# වියදම් ප්‍රභවය


වාර්ෂික විසර්ජන පනත  මගින් බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වෙන් කර දෙනු ලබන ප්‍රතිපාදන දේශීය අරමුදලට සීමාවී ඇත. එනම්, විදේශීය ආධාර යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් වැය ශීර්ෂය මගින් ප්‍රතිපාදන සලස්වා දී නොමැත.

2012 වර්ෂයේ මෙම වැය ශීර්ෂයට අදාල ව්‍යාපෘති සඳහා පුනරාවර්තන වියදම් රු. මිලියන 467 ක් දරා ඇත. මූලධන වියදම් සඳහා රු. මිලියන 52 ක්ද දරා ඇත. මෙම සියළු වියදම් දේශීය අරමුදල මගින් දරණ ලද වියදම් වේ.

**මූලධන**




**පුනරාවර්ථන**



# වියදම් මූල්‍යකරණ සාරාංශය

## (පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් වල ඓක්‍යය)

**වියදම් ශීර්ෂ අංකය: 276** **අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය බදුල්ල .**

**වැඩ සටහන් අංකය හා නාමය 01 - මෙහෙයුම් වැඩසටහන**

| මූල්‍යකරණය | | වැඩසටහන 1 * | | මුළු එකතුව | | |
|---|---|---|---|---|---|---|
| සංකේතය | සංකේත විස්තරය | ශුද්ධ ** ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | වියදමේ ප්‍රතිශතය |
| | | 1 | 2 | 3 | 4 | 4/3*100 |
| | | රු. | රු. | රු. | රු. | රු. |
| 11 | දේශීය අරමුදල් | 540,175,217 | 519,666,565 | 540,175,217 | 519,666,565 | 96 |
| 12 | විදේශීය ආධාර - ණය | | | | | |
| 13 | විදේශීය ආධාර - ප්‍රදාන | | | | | |
| 14 | ප්‍රතිපූර්ණය කල හැකි විදේශීය ආධාර - ණය | | | | | |
| 15 | ප්‍රතිපූර්ණය කල හැකි විදේශීය ආධාර - ප්‍රදාන | | | | | |
| 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් | | | | | |
| 17 | විදේශාධාර සම්බන්ධ දේශීය අරමුදල් | | | | | |
| 21 | විශේෂ නීති සේවා | | | | | |
| | එකතුව | 540,175,217 | 519,666,565 | 540,175,217 | 519,666,565 | 96 |
| | | | | | | |

# වියදම් මූල්‍යකරණ

## (වැඩසටහනක ව්‍යාපෘති අනුව පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් වල එකතුව)


වියදම් ශීර්ෂ අංකය: 276 අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය බදුල්ල .

වැඩ සටහන් අංකය හා නාමය 01 - මෙහෙයුම් වැඩසටහන

| මූල්‍යකරණය | | ව්‍යාපෘති 1 | | ව්‍යාපෘති 2 | | ව්‍යාපෘති 3 | | මුළු එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 11 | දේශීය අරමුදල් | 171,542,542 | 160,980,170 | 261,408,000 | 255,250,614 | 107,224,675 | 103,435,781 | 540,175,217 | 519,666,565 |
| 12 | විදේශීය ආධාර - ණය | | | | | | | | |
| 13 | විදේශීය ආධාර - ප්‍රදාන | | | | | | | | |
| 14 | ප්‍රතිපූර්ණය කල හැකි විදේශීය ආධාර - ණය | | | | | | | | |
| 15 | ප්‍රතිපූර්ණය කල හැකි විදේශීය ආධාර - ප්‍රදාන | | | | | | | | |
| 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් | | | | | | | | |
| 17 | විදේශාධාර සම්බන්ධ දේශීය අරමුදල් | | | | | | | | |
| 21 | විශේෂ නීතසේවා | | | | | | | | |
| | එකතුව ( මූලධන) | 171,542,542 | 160,980,170 | 261,408,000 | 255,250,614 | 107,224,675 | 103,435,781 | 540,175,217 | 519,666,565 |
| | | | | | | | | | |

## ආදායම් - 2012 වර්ෂයේ

ආදායම් ගණන් දීමේ නිලධාරීන්ට අයත් විවිධ ආදායම් ශීර්ෂ සඳහා ආදායම් රැස් කිරීමේ කාර්යය මෙම කාර්යාලය හා එයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රධාන කාර්යයන් අතරට ගැනේ . 2012 වර්ෂයේ දී රැස්කරන ලද මුළු ආදායම රු. මිලියන 81 කට ආසන්නවේ . එයින් රු. මි. 22 ක මුදල් රජයේ නිලධාරීන්ගේ ණය පොලී හා වැන්දඹු අනත්දරු සඳහා රජයේ නිලධාරීන්ගෙන් අයකරන ගැනිම් වේ. එම ආදායම් හැර රැස්කරනු ලබන ආදායම රු. මිලියන 59 ක් පමණ වේ.




**ඒ ඒ ආදායම් ශීර්ෂ යටතේ එකතු කරන ලද ආදායම් විස්තර පහතින් දැක්වේ.**

| **ආදායම් ශීර්ෂය** | **විස්තරය** | එකතුව **මුළු ආදායම (රු.)** |
|---|---|---|
| 1003-07-02 | රෙජි.ජ.දෙපාර්.අදාල ලියාපදිංචි ගා. | 157,826.00 |
| 1003-07-03 | පෞ.දැව ප්‍රවාහනය | 712,498.84 |
| 1003-07-05 | මහජන ආ.නීතිය හා සාමය පිළිබද අමා.අදාල බල.ගාස්තු | 166,970.00 |
| 1003-07-99 | අනෙකුත් බලපත්‍ර ගා | 3,646,984.42 |
| 2002-01-01 | රජයේ ගොඩනැගිලි කුලී | 1,946,146.41 |
| 2002-01-02 | රජයේ කැලෑ වලින් ලද අදායම් | 398,962.50 |
| 2002-02-99 | වෙනත් | 4,897,004.93 |
| 2003-01-00 | දෙපාර්.විකුණුම් | 5,846,364.60 |
| 2003-02-07 | විසා හා ගමන් බල.ගාස්තු | 3,858,700.00 |
| 2003-02-13 | විභාග ගාස්තු | 4,083,096.00 |
| 2003-02-14 | මෝ.රථ ප්‍ර.පනත යටතේ.ගා. | 29,689,775.00 |
| 2003-02-99 | විවිධ | 9,017,524.75 |
| 2003-03-00 | දඩ මුදල් හා රාජ්‍ය සන්තක කිරීම | 112,416.36 |
| 2003-99-00 | අනෙකුත් ලැබීම් | 360,534.20 |
| 2004-01-00 | මධ්‍යම රජය | 16,836,736.35 |
| එකතුව | | **81,263,811.57** |

## තැන්පත් ගිණුම

### බදුල්ල දිස්ත්‍රික් ලේකම්

6003/0/0/52/0 වන බදුල්ල දිස්ත්‍රික් ලේකම් නව තැන්පත් ගිණුම යටතේ විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා රජයේ අනෙකුත් කාර්යාලවලින් ලැබෙන ලැබීම් හා ගෙවීම් පවත්වාගෙන යනු ලබයි. විශේෂයෙන්ම එම කාර්යාලවල කටයුතු ප්‍රාදේශීය මට්ටමින් ඉටුකර ගැනිමට අවශ්‍ය වු විට මෙම තැන්පත් ගිණුම යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් අවශ්‍ය මුල්‍ය කටයුතු පවත්වාගෙන යනු ලබයි. ඒකී කාර්යයන් ඉටුකර ගැනීමට මෙම කාර්යාලය තම සහය දක්වනු ලැබේ. ඒ තුලින් රජයේ කාර්යාල අතර අන්තර සම්බන්ධතාවය වර්ධනය කර ගනිමින් වඩාත් විධිමත් රාජ්‍ය සේවාවක් පවත්වාගෙන යාමට හැකි වේ.

**2012 වර්ෂයේ තැන්පත් ගිණුමට අදාල**
**ලැබීම් සහ ගෙවීම් සාරාංශය**


**ගිණුම් අංක – 6003 / 0 / 0 / 52 / 0**

| *2012.01.01 දිනට ආරම්භක බැර ශේෂය* | *2012 වර්ෂය තුල මුළු හර* | *2012 වර්ෂය තුල මුළු බැර* | *වර්ෂයේ අවසාන ශේෂය* |
|---|---|---|---|
| 202,533,036 | 192,383,804 | 432,213,017 | 442,362,249 |

# රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම

බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ක සේවය කරන නිලධාරීන් සඳහා රජය මඟින් ලබා දෙන ණය ගෙවීම් හා ලැබීම් පාලනය දිස්ත්‍රික් ලේකම් අත්තිකාරම් බී ගිණුම වන 27601 යටතේ සිදු කරයි. ණය ගෙවීම් හා ලැබීම් ගිණුම්ගත කිරීම සඳහා 276011 වශයෙන් ගිණුමක් හා වැය ශීර්ෂ අතර ණය නිරවුල් කර ගැනීම සඳහා 276012 වශයෙන් ගිණුමක් පවත්වා ගෙන යනු ලැබේ.

රජයේ නිලධාරීන් සඳහා රජය මඟින් ගෙවනු ලබන ණය වර්ග අතර ආපදා ණය, උත්සව අත්තිකාරම් හා විශේෂ අත්තිකාරම් ප්‍රධාන වේ.




| 2012 අත්තිකාරම් බි ගිණුම | |
|---|---|
| විස්තරය | මුදල |
| වර්ෂය තුළ ණය ගෙවීමට ලැබුණු මුළු මුදල | 36,100,000 |
| වර්ෂය තුළ ගෙවන ලද මුළු ණය මුදල | 38,854,061 |
| වර්ෂය තුළ අයකර ගන්නා ලද මුළු ණය මුදල | 39,331,253 |
| තවදුරටත අයකර ගැනීමට පවතින මුළු ණය මුදල | 126,669,382 |

# අ ග්‍රිම විස්තරය


## 20 12 වර්ෂය

මෙම කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මැදිහත් වීම මත 2012 වර්ෂයේ ක්‍රියාත්මක කළ සංවර්ධන වැඩසටහන්, සුබසාධන වැඩසටහන් ඇතුළු විවිධ වැඩසටහන් සඳහා අවශ්‍ය මුල්‍ය සම්බන්ධීකරණය සිදු කිරීමට අවශ්‍ය අග්‍රිම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පාලනය මත ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත ලබාදෙන ලදි .

2012 වර්ෂයේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම සඳහා රු-මිලියන 4,476 ක අක්මුදල් ලබා දී ඇත. එයට අමතරව අප කාර්යාල වලින් රැස්කර ගන්නා ලද මුදල රු මිලියන 216 කි. එම අග්‍රිම මුදල ,එනම් මිලියන 4,692 ක මුදලක් 2012 වර්ෂයේ වියදම් කර තිබුණි.

| මාසය | භාණ්ඩාගාරයෙන් ලැබුණු අක් මුදල්<br><br>රු. මිලියන | වෙනත් ලැබීම් (මුදලින්)<br><br>රු. මිලියන | මුළු ලැබීම්<br><br>රු. මිලියන | මුළු ගෙවීම්<br><br>රු. මිලියන |
|---|---|---|---|---|
| ජනවාරි | 447.1 | 30.9 | 478 | 99.4 |
| පෙබරවාරි | 431.6 | 20.7 | 452.3 | 675.6 |
| මාර්තු | 283.5 | 12.1 | 295.6 | 381.1 |
| අප්‍රේල් | 490.6 | 11.2 | 501.8 | 376.1 |
| මැයි | 386.2 | 24.0 | 410.2 | 326.3 |
| ජුනි | 481.1 | 12.8 | 493.9 | 662.2 |
| ජුලි | 548.0 | 15.2 | 563.2 | 340.8 |
| අගෝස්තු | 205.9 | 18.0 | 223.9 | 258.9 |
| සැප්තැම්බර් | 184.4 | 18.5 | 202.9 | 390.0 |
| ඔක්තෝබර් | 438.9 | 14.9 | 453.8 | 335.3 |
| නොවැම්බර් | 418.7 | 21.1 | 439.8 | 287.3 |
| දෙසැම්බර් | 160.1 | 16.1 | 176.2 | 558.5 |
| එකතුව | 4476.1 | 215.5 | 4691.6 | 4691.6 |


### අග්‍රිම ලැබීම් හා ගෙවීම් - 2012 වර්ෂය



# වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අදාලව 20 12 වර්ෂයේ ඉටු කළ කාර්යයන්

අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල ප්‍රාදේශීය කාර්යයන් බොහෝමයක් සම්බන්ධීකරණය කරනු ලබන්නේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟිනි. ඒ සඳහා අවශ්‍ය කරන මුල්‍ය ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් මඟින් ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත නිදහස් කරන අතරම, මුල්‍ය කළමනාකරණ කටයුතු දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ඉටු කරයි.

2012 වර්ෂයේ දී අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 32 ක් යටතේ ප්‍රතිපාදන වෙන්කර දි තිබුණි. එම ප්‍රතිපාදන වලින් විවිධ කටයුතු ඉටුකරන ලදි. ඒ අතුරින්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ගම නැගුම වැඩසටහන, දිවි නැගුම හා පුබුදමු වෙල්ලස වැඩසටහන් සමෘද්ධි කොමසාරිස් ජනරාල්වරයා යටතේ ක්‍රියාත්මක වන සමෘද්ධි වැඩසටහන, ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වැඩසටහන් ප්‍රධාන වේ.




## ගම නැගුම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

ග්‍රාමීය යටිතල පහසුකම් දියුණු කිරීම තුලින් ග්‍රාමීය සමාජ, ආර්ථික සංවර්ධනය ඇති කිරීමේ අරමුණින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් 2012 වර්ෂයේදී ද ගම නැගුම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි. එකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ඒ ඒ දිස්ත්‍රික් මට්ටමින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් සම්බන්ධීකරණය වු අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි. .

එම ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති 567 ක් බදුල්ල දිස්ත්‍රික්කය පුරා ක්‍රියාත්මක කළ අතර, ඒ සඳහා දරණ ලද මුළු වියදම රු. මිලියන 485 ක් පමණ වේ. ගම නැගුම වැඩසටහන යටතේ මාර්ග, පානීය ජල, වාරිමාර්ග, පාලම්, බෝක්කු, ගොඩනැගිලි, වැනි ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කරන ලදි.


### ජාතික සවිය ගම නැගුම ක්‍රියාත්මක කළ ව්‍යාපෘති හා වියදම

| | අනුමත ව්‍යාපෘති ගණන | වියදම රු මිලියන |
|---|---|---|
| මහියංගන | 35 | 33 |
| රිදීමාලියද්ද | 42 | 37 |
| මීගහකිවුල | 20 | 18 |
| කන්දකැටිය | 26 | 22 |
| සොරණාතොට | 25 | 24 |
| බදුල්ල | 29 | 28 |
| පස්සර | 41 | 37 |
| හාලිඇල | 57 | 31 |
| වැලිමඩ | 64 | 48 |
| ඌවපරණගම | 68 | 66 |
| බණ්ඩාරවෙල | 35 | 33 |
| ඇල්ල | 32 | 30 |
| හපුතලේ | 26 | 20 |
| හල්දුම්මුල්ල | 39 | 23 |
| ලුණුගල | 28 | 26 |
| දි.ලේ | | 9 |
| එකතුව | 567 | 485 |

## විමධ්‍යගත අයවැය වැඩසටහන – 2012 වර්ෂය

පාර්ලිමේන්තු මැති ඇමතිවරුන් වෙත විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ප්‍රාදේශීය සංවර්ධනය සඳහා වෙන්කර දෙනු ලබන ප්‍රතිපාදන තුලින් වාර්ෂිකව ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති රාසියක් ක්‍රියාත්මක කරයි. 2012 වර්ෂයේ දී බදුල්ල දිස්ත්‍රික්කය එම වැඩසටහන යටතේ ව්‍යාපෘති 678 ක් ක්‍රියාත්මක කළ අතර, ඒ සඳහා දරණ ලද මුළු වියදම රු මිලියන 39.76 ක් පමණ වේ.

### විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ක්‍රියාත්මක කළ ව්‍යාපාති



**විමධ්‍යගත වැඩසටහන**

**ක්‍රියාත්මක කළ ව්‍යාපෘති හා වියදම**

| | ව්‍යාපෘති ගණන | වියදම රු මිලියන |
|---|---|---|
| ➢ මහියංගන | 56 | 3.93 |
| ➢ රිදිමාලියද්ද | 58 | 4.52 |
| ➢ මීගහකිවුල | 22 | 1.15 |
| ➢ කන්දකැටිය | 22 | 1.31 |
| ➢ සොරණාතොට | 29 | 1.85 |
| ➢ බදුල්ල | 56 | 2.21 |
| ➢ පස්සර | 36 | 1.85 |
| ➢ හාලිඇල | 109 | 0.94 |
| ➢ වැලිමඩ | 57 | 6.64 |
| ➢ ඌවපරණගම | 56 | 2.17 |
| ➢ බණ්ඩාරවෙල | 54 | 3.11 |
| ➢ ඇල්ල | 36 | 2.06 |
| ➢ හපුතලේ | 41 | 1.02 |
| ➢ හල්දුම්මුල්ල | 25 | 3.37 |
| ➢ ලුණුගල | 21 | 2.93 |
| ➢ පරිපාලන වියදම් | | 0.66 |
| ➢ එකතුව | 678 | 39.76 |

## දිවි නැගුම වැඩසටහන - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

**පැල බෙදාදීම - 2012 වර්ෂය**

| අනු අංකය | පැල වර්ගය | ලබාදුන් පැළ ප්‍රමාණය | වියදම |
|---|---|---|---|
| 1 | පළතුරු | 197,310 | 20,887,103 |
| 2 | පොල් | 161,718 | 2,383,250 |
| 3 | අපනයන භෝග | 49,920 | 966,228 |
| 4 | ඖෂධ | 36,669 | 1,682,635 |
| 5 | කජු | 23,699 | 5,549,800 |
| 6 | වනවගා | 14,328 | 1,336,970 |
| 7 | එළවළු | 35,880 | 56,395 |
| 8 | මිරිස් මුරුංගා | 10,000 | 585,600 |
| 9 | කුරක්කන් | 41 | 4,715 |
| | එකතුව | 529,565 | 33,452,696 |

## සත්ව පාලනය

| අනු අංකය | වර්ගය | ලබාදුන් ප්‍රමාණය | වියදම |
|---|---|---|---|
| 1 | මීමැසි පෙට්ටි | 576 | 612,351 |
| 2 | මීමැසි පෙට්ටි - පුහුණු | 7 | 48,911 |
| 3 | කුකුල් පැටවි | 18,130 | 6,890,650 |
| 4 | කුකුල් කූඩු | 2,590 | 10,415,091 |
| | එකතුව | 21,303 | 17,967,003 |

## කර්මාන්ත


| අනු අංකය | වර්ගය | ලබාදුන් ප්‍රමාණය | වියදම |
|---|---|---|---|
| 1 | ගෘහස්ථ කර්මාන්ත-පුහුණු | 576 | 612,351 |
| 2 | කර්මාන්ත ප්‍රදර්ශනය | 7 | 48,911 |
| 3 | ස්වයං රැකියා හා කර්මාන්ත උපකරණ | 18,130 | 6,890,650 |
| | එකතුව | 18,713 | 7,551,912 |

# සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක කිරීම

ග්‍රාමීය ජනතාවගේ සමාජීය, ආර්ථික සංවර්ධනයක් ඇති කිරීමේ අභිලාශයෙන් ක්‍රියාත්මක සමෘද්ධි සංවර්ධන වැඩසටහන යටතේ 2012 වර්ෂයේදී සමෘද්ධි අධිකාරිය යටතේ දරණ ලද මුළු වියදම රු-මිලියන 476 ක් පමණ වන අතර, සමෘද්ධි කොමසාරිස් ජනරාල් වැය ශීර්ෂය යටතේ ක්‍රියාත්මක කළ වැඩසටහන් සඳහා දරණ ලද වියදම රු-මිලියන 498 ක් පමණ වේ. ඒ අනුව සමෘද්ධි වැඩසටහන සඳහා බදුල්ල දිස්ත්‍රික්කයේ කටයුතු වෙනුවෙන් දරණ ලද මුළු වියදම ආසන්න වශයෙන් රු:මිලියන 934 ක් පමණ වේ.

**සමෘද්ධි කොමසාරිස් වැය ශීර්ෂය යටතේ දරණ ලද වියදම්**

| | රු. මිලියන |
|---|---|
| සමෘද්ධි සහනාධාර | 428.6 |
| පෝෂණ මුද්දර | 25.5 |
| අනෙකුත් | 3.9 |
| **එකතුව** | 458.0 |




සමෘද්ධි අධිකාරිය යටතේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති අතර ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දිවි නැගුම වැඩසටහනට සමගාමීව ක්‍රියාත්මක කළ සමෘද්ධි ග්‍රාම නිලධාරි වසම් සංවර්ධනය කිරීමේ වැඩසටහන ප්‍රධාන වේ. බදුල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරි වසම් 567 ක් සංවර්ධනය ඒ යටතේ සිදු විය. එහිදී,

1. යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
2. ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
3. දිරිය පියස නිවාස සංවර්ධන වැඩසටහන හා සදාචාරාත්මක සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු විය.

එහිදී තෝරා ගත් වසම් 567 හි ඉහත වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර, ඒ යටතේ ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කරන ලදි.

## දිවි නැගුම වැඩසටහනට සමගාමීව 2012 වර්ෂයේ බදුල්ල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කළ සමෘද්ධි ව්‍යාපෘති

### 1.ජීවනෝපාය ව්‍යාපෘති - 2012

| වැඩසටහන | අංශය | ව්‍යාපෘතිය | ඉලක්ක ව්‍යාපෘති සංඛ්‍යාව | අපේක්ෂිත මුදල රු.මි. | වෙන් කල ප්‍රතිපාදන රු.මි. | ක්‍රියාත්මක කළ ව්‍යාපෘති සංඛ්‍යාව | වැය කළ මුදල රු.මි. |
|---|---|---|---|---|---|---|---|
| දිවිනැගුම " ජාතික වැඩසටහනට සමගාමීව සමෘද්ධි ජීවනෝපාය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | කෘෂි ව්‍යාපෘති | ආරක්ෂිත දැල් ගෘහ (රු.80000 බැගින්) | 400 | 32.00 | 15.76 | 197 | 15.69 |
| | | විසිතුරු මල් වගාව (රු.25000 බැගින්) | 90 | 3.60 | 1.88 | 75 | 1.75 |
| | | මීමැසි පාලනය (රු.2000 බැගින්) | 450 | 0.90 | 0.46 | 230 | 0.45 |
| | | බිම් මල් වගාව (රු.10000 බැගින්) | 500 | 5.00 | 1.96 | 196 | 2.02 |
| | සත්ත්ව පාලන ව්‍යාපෘති | ගවගාල් ඉදිකිරීම (රු.35000 බැගින්) | 1000 | 25.00 | 8.47 | 242 | 8.36 |
| | | එළු පාලනය (රු.15000 බැගින්) | 50 | 0.75 | 0.45 | 30 | 0.00 |
| | | විසිතුරු මසුන් ඇතිකිරීම (රු.36000 බැගින්) | 25 | 0.90 | 0.00 | 0 | 0.00 |
| | කර්මාන්ත ව්‍යාපෘති | කිතුල් ගස් මැදීම (රු.5000 බැගින්) | 500 | 2.50 | 1.32 | 271 | 1.27 |
| | | කිතුල් ආශ්‍රිත ක්ෂුද්‍ර කර්මාන්ත (රු.30000 බැගින්) | 100 | 3.00 | 1.38 | 42 | 1.24 |
| **උප එකතුව** | | | **3115** | **73.65** | **31.68** | **1283** | **30.78** |

### "දිවිනැගුම" ජාතික වැඩසටහන තෙවන අදියර - 2012

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ග්‍රාම නිළධාරි වසම් ගණන | රෝපණ ද්‍රව්‍ය බෙදාහැරීම - බීජ කට්ටල සංඛ්‍යාව - 3 වන අදියර | බීජ කට්ටල සංඛ්‍යාව - 4 වන අදියර |
|---|---|---|---|
| මහියංගණය | 35 | 5250 | 22552 |
| රිදීමාලියද්ද | 42 | 6300 | 14696 |
| කන්දකැටිය | 26 | 3900 | 7092 |
| මීගහකිවුල | 20 | 3000 | 6089 |
| සොරණාතොට | 25 | 3750 | 6909 |
| බදුල්ල | 29 | 4350 | 21350 |
| පස්සර | 41 | 8550 | 13817 |
| ලුණුගල | 28 | 4800 | 8032 |
| හාලිඇල | 57 | 5250 | 26934 |
| ඇල්ල | 32 | 3900 | 13800 |
| බණ්ඩාරවෙල | 35 | 5850 | 15942 |
| හපුතලේ | 26 | 9600 | 13014 |
| හල්දුම්මුල්ල | 39 | 10200 | 12337 |

| | | | |
|---|---|---|---|
| වැලිමඩ | 64 | 4200 | 27202 |
| ඌවපරණගම | 68 | 6150 | 22650 |
| එකතුව | 567 | 85050 | 232416 |

| යටිතල පහසුකම් ව්‍යාපෘති - 2012 | | | | | |
|---|---|---|---|---|---|
| වැඩසටහන | ව්‍යාපෘතිය | ප්‍රතිලාභි පවුල් සංඛ්‍යාව | වෙන් කළ ප්‍රතිපාදන රු.මි. | නිමකළ ව්‍යාපෘති සංඛ්‍යාව | වැය කළ මුදල රු.මි. |
| ජීවනෝපාය ව්‍යාපෘති සඳහා සෘජුවම ඉවහල්වන යටිතල පහසුකම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම (සොරණාතොට, බණ්ඩාරවෙල) | කොස්ගොල්ල හැවන්කුඹුර ඇල කොන්ක්‍රීට් කිරීම | 16 | 499,857.81 | 1 | 62876.84 |
| | බඹරගම-පෙරමස්අරාව ඇල හා අමුණ ඉදිකිරීම | 40 | 499,150.00 | 1 | 492910.62 |
| **උප එකතුව** | | **56** | **7.44** | **2** | **555787.46** |

| නිවාස වැඩසටහන - 2012 | | | | | |
|---|---|---|---|---|---|
| වැඩසටහන | නිවාසව්‍යාපෘති සංඛ්‍යාව | වෙන් කළ ප්‍රතිපාදන රු.මි. | ලද මුදල රු.මි. | ආරම්භ කළ ව්‍යාපෘති සංඛ්‍යාව | නිම කළ ව්‍යාපෘති සංඛ්‍යාව |
| දිරිය පියස නිවාස - (කොට්ඨාශයට වෙන් කළ ප්‍රතිපාදන අනුව) | 44 | 2.00 | 2.00 | 44 | 32 |
| සමෘද්ධි නිවාස ලොතරැයි අරමුදල -2010 ජයග්‍රාහී චෙක්පත් නිකුත් කිරීම | 29 | 4.35 | 4.35 | 29 | 29 |
| සමෘද්ධි නිවාස ලොතරැයි අරමුදල - 2011 ජයග්‍රාහී චෙක්පත් නිකුත් කිරීම | 47 | 7.05 | 7.05 | 41 | |
| සමෘද්ධි නිවාස ලොතරැයි අරමුදල - 2007,2008,2009 සහ 2010 වසරවල විවිධ හේතූන් නිසා නොගෙවූ ත්‍යාග මුදල් නිදහස් කිරීම | 17 | 2.55 | 2.55 | 17 | |

## අනිකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන් 33 2012 වර්ෂයේ ලැබුණු ප්‍රතිපාදන , වියදම් හා ඉතිරිය

| අනු අංකය | වැය ශීර්ෂය | අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | වෙන් කල ප්‍රතිපාදන(රු.) | වර්ෂයේ මුළු වියදම(රු.) | ඉතිරිය(රු.) |
|---|---|---|---|---|---|
| 1 | 101 | බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය | 22,382,733 | 20,912,510 | 1,470,223 |
| 2 | 103 | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය | 372,975 | 360,771 | 12,204 |
| 3 | 105 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 2,993,540,290 | 2,902,507,798 | 91,032,492 |
| 4 | 106 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 12,363,670 | 9,348,309 | 3,015,361 |
| 5 | 110 | අධිකරණ අමාත්‍යාංශය | 2,724,190 | 2,375,056 | 349,134 |
| 6 | 117 | වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය | 50,000 | 49,980 | 20 |
| 7 | 118 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 23,110,000 | 5,070,702 | 18,039,298 |
| 8 | 120 | ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | 23,501,245 | 22,412,743 | 1,088,502 |
| 9 | 121 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 14,781,083 | 14,674,562 | 106,520 |
| 10 | 124 | සමාජ සේවා අමාත්‍යාංශය | 19,329,969 | 19,304,062 | 25,907 |
| 11 | 133 | තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | 8,668,436 | 8,052,889 | 615,547 |
| 12 | 134 | ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය | 612,525 | 608,721 | 3,804 |
| 13 | 152 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 2,028,617 | 1,916,574 | 112,043 |
| 14 | 153 | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 4,754,961 | 4,558,332 | 196,629 |
| 15 | 156 | යෞවන කටයුතු අමාත්‍යාංශය | 1,147,925 | 1,108,324 | 39,601 |
| 16 | 160 | පරිසර අමාත්‍යාංශය | 25,000 | 24,988 | 12 |
| 17 | 177 | සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය | 7,057,431 | 5,631,252 | 1,426,179 |
| 18 | 179 | ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය | 66,188 | 66,188 | 0 |
| 19 | 183 | මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍යාංශය | 4,041,561 | 3,802,201 | 239,360 |
| 20 | 201 | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | 24,284,480 | 22,337,371 | 1,947,109 |
| 21 | 206 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 260,902 | 239,050 | 21,853 |
| 22 | 210 | ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | 8,000 | 7,886 | 114 |
| 23 | 216 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 6,145,610 | 6,136,028 | 9,582 |
| 24 | 217 | පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 7,272,430 | 6,061,667 | 1,210,763 |
| 25 | 218 | සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 506,690,190 | 498,120,501 | 8,569,689 |
| 26 | 220 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | 218,514 | 218,514 | - |
| 27 | 226 | ආගමන විගමන දෙපාර්තමේන්තුව | 15,975 | 15,900 | 75 |
| 28 | 252 | ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | 25,506,505 | 23,585,396 | 1,921,109 |
| 29 | 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 706,935,350 | 694,613,495 | 12,321,856 |
| 30 | 285 | කෘෂිකර්ම දෙපාර්තමේන්තු | 288,664 | 288,664 | - |
| 31 | 286 | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | 14,780 | 14,780 | - |
| 32 | 300 | ආහාර පාලන දෙපාර්තමේන්තුව | 1,241,650 | 1,240,650 | 1,000 |
| 33 | 307 | මොටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 1,447,698 | 1,118,408 | 329,291 |
| 34 | 327 | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් දේපාර්තමේන්තුව | 4,718,709 | 4,376,184 | 342,525 |
| 35 | 328 | මිනිස් බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව | 1,796,610 | 1,661,670 | 134,940 |
| එකතුව | | | 4,427,404,863 | 4,282,822,122 | 144,582,741 |

- ගම නැගුම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
- විමධ්‍යගත වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- සී.බී.ආර්. වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- විශ්‍රාම වැටුප් ක්‍රියාත්මක කිරීම.
- සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- ආපදා කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ඉඩම් අත්පත් කිරීමේ කටයුතු
- උපත්/මරණ/විවාහ ලියාපදිංචි කිරීමේ කටයුතු
- ඉඩම් සම්බන්ධ අනෙකුත් කටයුතු
- වාහන ආදායම් බලපත්‍ර නිකුත් කිරීම ඇතුළු ඊට සම්බන්ධ කටයුතු
- ආබාධිත පුද්ගලයින් සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- සමාජ සේවා කටයුතු
- ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ග්‍රාමීය හා ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- සෞඛ්‍ය වැඩසටහන්
- ළමා හා කාන්තා සංවර්ධන වැඩසටහන්
- ජාතික ආරක්ෂක වැඩසටහන්
- කෘෂිකර්ම වැඩසටහන්
- පරිසර සංරක්ෂණ වැඩසටහන්

ඇතුළු වැඩසටහන් රාශියක් අප කාර්යාල විසින් ඉටුකරන ලදී.

මෙයට අමතරව පළාත් සභා ව්‍යාපෘති රාශියක්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල මැදිහත් වීමෙන් සිදුකරන ලදී.

- ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘති
- විදුල/ ජල ව්‍යාපෘති
- ගොඩනැගිලි ඉදිකිරීම
- වෙනත් සමාජ සේවා ව්‍යාපෘති

## යහපත් මහජන සේවාවන් ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග

- පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.
- බාහිර ආයතනික සම්බන්ධතා විධිමත් කිරීම.
- ප්‍රාදේශීය සංවර්ධනයේදී ජනතා සහභාගීත්වය තුලින් සංවර්ධනය සැලසුම් කිරීම.
- සේවා ලාභියාගේ අවශ්‍යතා පදනම් කරගෙන නියමිත කාලයක් තුළ ගැටළු විසඳීමට කටයුතු කිරීම.
- කාර්යාල පද්ධතිය සේවා ලාභීන්ට පහසු වන පරිදි සැකසීම.
- කාර්යාල අලංකාර කිරීම.
- සේවක සුභසාධන වර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- තොරතුරු මධ්‍යස්ථාන පිහිටුවීම.
- සේවකයන් පුහුණු කිරීම.
- ආකල්ප වර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පංචවිධ සංකල්ප ක්‍රියාත්මක කිරීම.
- ඵලදායිතා කව පිහිටුවීම හා ඒ තුළින් ඵලදායිතාව වැඩිකිරීම.